**ශීර්ෂය 279 කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

## 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(අ) ව්‍යවස්ථාපිත අණ පනත් මඟින් පැවරී ඇති බලතල හා වගකීම් ඉටු කිරීම.

(ආ) රජයේ ප්‍රධාන සංවර්ධන වැඩ සටහන් හා සංවර්ධන ව්‍යාපෘති (සමෘද්ධි, ගම නැගුම හා විමධ්‍යගත වැඩ සටහන්) රජයේ නියමයන්, උපදෙස් හා මඟ පෙන්වීම්වලට අනුකූලවන පරිදි ක්‍රියාවට නැංවීම හා සහතික කිරීම.

(ඇ) දිස්ත්‍රික්කයේ සියළු රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන මඟින් ජනතා අභිවෘද්ධිය සඳහා ඉටු කරනු ලබන සංවර්ධන වැඩ සටහන් හා පරිපාලන කටයුතු යථාවත් පරිදි ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සමායෝජනය, සම්බන්ධීකරණය හා මඟ පෙන්වීම.

(ඈ) ආණ්ඩුවේ දිස්ත්‍රික් නියෝජිතයා ලෙස කටයුතු කිරීම.

(ඉ) ස්වභාවික හා වෙනත් ව්‍යවසන හා ආපදා දිස්ත්‍රික්කය තුළ ඇති වූ අවස්ථාවලදී ප්‍රායෝගිකව මැදිහත් වී කටයුතු කිරීම.

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ) කෑගල්ල
(ආ) මාවනැල්ල
(ඇ) අරණායක
(ඈ) බුලත්කොහුපිටිය
(ඉ) රඹුක්කන
(ඊ) ගලිගමුව
(උ) වරකාපොල
(ඌ) දෙහිඕවිට
(එ) රුවන්වැල්ල
(ඒ) යටියන්තොට
(ඔ) දැරණියගල

## 1.3 විගණන විෂය පථය

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 18 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල

නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම.**

---------------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.5 විගණන නිරික්ෂණය**

----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| (i) ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 447(5) |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

අත්සන් ලේඛන හා බිල්පත් ආදි වූ අවශ්‍ය සාක්ෂි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නොතිබීම නිසා එකතුව රු.810,000 කට අදාල වූ ගනුදෙනු 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**(ඇ) විසර්ජන ගිණුම**

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.745,944,806 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.738,218,173 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.7,726,633 ක් හෙවත් සියයට 1.04 ක් ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 645,044,806 | 644,976,577 | 68,229 | 0.01 |
| මූලධන | 100,900,000 | 93,241,596 | 7,658,404 | 7.59 |
| **එකතුව** | **745,944,806** | **738,218,173** | **7,726,633** | **1.04** |

**(ii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 26 ක් හා දෙපාර්තමේන්තු 21 ක් විසින් එකතුව රු.3,765,088,007 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු අතර, එම ප්‍රතිපාදන පිළිවෙලින් රු.1,042,126,222 ක් හා රු.1,553,969,073 ක් වශයෙන් එකතුව රු.2,596,095,295 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට, ඉතිරිය පිළිවෙලින් රු.1,158,275,426 ක් හා රු.10,717,286 ක් වශයෙන් එකතුව රු.1,168,992,712 ක් හෙවත්, ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 52.6 ක හා සියයට 0.7 ක් වී තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 27901 | 42,000,000 | 34,597,409 | 29,000,000 | 34,153,098 | 170,000,000 | 130,554,202 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විෂය අංක 27901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.988,215 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පත් ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.274,724,388 ක් වූ අතර ඉන් වර්ෂ දෙකකට වැඩි කාලයක් ඉක්මවා තිබුණු එකතුව රු.935,968 ක් වූ තැන්පතු ශේෂ 34 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.6 අනුකූල නොවීම්

**(අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| (i) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| XLVIII පරිච්ඡේදයේ 27.11 වගන්තිය හා 31.11 වගන්තිය | 571,838 | අල්ලස් ගැනීම හේතු කොටගෙන අත්අඩංගුවට ගෙන නඩු පවරා තිබුණු ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකුට එරෙහිව විගණන දිනය වූ 2014 පෙබරවාරි 07 දින වන විටත්, දෙපාර්තමේන්තුව විසින් විනය පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. තවද, අදාල නිලධාරියා අත්අඩංගුවට ගෙන නඩු පැවරූ දිනයේ සිට වැඩ තහනම් කර වැටුප් ගෙවීම අත්හිටවිය යුතු වුවද, වැඩ තහනම් කර වැටුප් ගෙවීම 2013 දෙසැම්බර් 30 දින අත්හිටුවා තිබුණි. අත්අඩංගුවට පත් වූ 2011 නොවැම්බර් 25 දින සිට 2013 දෙසැම්බර් 30 දින දක්වා කාලය තුළ රාජකාරි ඉටුකර නොතිබියදී වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| (ii) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| • මුදල් රෙගුලාසි 115(3) (ආ) | 13,500 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරියෙකු සම්බන්ධයෙන් පවත්වනු ලැබූ විනය පරීක්ෂණයක පැමිණිල්ල මෙහෙයවීමට අදාල නිලධාරියෙකු |

| | | |
|---|---|---|
| | | වෙත ඉකුත් වර්ෂයේ ඉන්ධන වියදම් පියවීම වෙනුවෙන් පූර්ව අනුමැතිය හා ඉන්ධන ලබාගෙන ඇති දිනවල විනය පරීක්ෂණය පැවැත් වූ බව පැමිණීමේ සහතිකයකින් තහවුරු කිරීමෙන් තොරව ඉක්ධන වියදම ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| • මුදල් රෙගුලාසි 137 හා 138 | 623,187 | සැපයීම් සම්බන්ධයෙන් වන අවස්ථාවලදී භාණ්ඩ පරීක්ෂා කර නිවැරදි ලෙස භාරගෙන තිබෙන බව තහවුරු කරගෙන අනුමත කිරීම සහ සහතික කිරීම කළ යුතු වුවත්, කෑගල්ල හා යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2013 දෙසැම්බර් 31 දින ගබඩාවට භාණ්ඩ ලැබී නොතිබියදී ගෙවීම් වවුචර් අනුමත කර සහතික කර චෙක්පත් මගින් ගෙවීම් කර තිබුණි. |
| • මුදල් රෙගුලාසි 206 | 334,957 | දැරණියගල හා රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පොදු තැන්පත් ආපසු ගෙවීමේදී භාවිතා කරනු ලබන රික්විෂන් පත්‍රයේ සඳහන් ගෙවීම් නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කර නොතිබුණි. |
| • මුදල් රෙගුලාසි 237 (ආ) | 161,263 | ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී භාණ්ඩ ලැබී ඇති බවටද, අදාල බඩු ලේඛනයෙහි හෝ තොග පොතෙහි එකී භාණ්ඩ ලැබුණු බව සඳහන් කර ඇති බවට සහතිකයක් ඇමිණිය යුතු වුවත්, කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අවස්ථා 04 කදී හා ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවස්ථා 05 කදී සිදු |

කර තිබුණු මිලදී ගැනීම් සම්බන්ධයෙන්
එසේ කටයුතු කර නොතිබුණි.

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන ගැසට් නිවේදනය අනුව බලපත්‍ර නිකුත් කිරීමේදී අයකරනු ලබන මුද්දර ගාස්තු නියමිත දින හෝ එදිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළයුතු වුවද, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2013 වර්ෂයේදී දැව ප්‍රවාහන බලපත්‍ර හා මත්පැන් බලපත්‍ර නිකුත් කිරීමේදී අවස්ථා 08 කදී අයකළ එකතුව රු.311,738 ක් වූ මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීමේදී දින 57 සිට දින 150 දක්වා කාල පරාසයක් තුළ ප්‍රමාද කර තිබුණි.

**1.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් හා අනෙකුත් කරුණු පිළිබඳ විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | නිමකළ දිනය | 2013 දෙසැම්බර් 31 දිනට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|---|
| | රු. | | | | රු. | |
| නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය ඉදිකිරීම | 294,982,342 | 2011.05.11 | 2013.05.10 | නිමකර නැත | 91,216,068 | කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතාවය |
| දැරණියගල ප්‍රා.ලේ.කොට්ඨාශයේ මියනවිට ග්‍රාමීය | 678,868 | 2013.12.20 | 2013.12.25 | - | - | - එම - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම | | | | | | |
| දැරණියගල ප්‍රා.ලේ.කොට්ඨාශයේ මියනවිට වගල කුඹුර අමුණ ඉදිකිරීම | 576,563 | 2013.12.23 | 2014.02.04 | - | - | - එම - |
| දැරණියගල ප්‍රා.ලේ.කොට්ඨාශයේ හම්බානවල පීල්ල මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 294,000 | 2013.12.20 | 2013.12.25 | - | - | - එම - |
| යටියන්තොට ප්‍රා.ලේ.කොට්ඨාශයේ සීපෝත් මාතෘ සායන මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම | 1,204,998 | 2013.11.27 | 2013.12.27 | - | 110,000 | - එම - |

**(ආ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

විමධ්‍යගත අයවැය යටතේ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාල එකතුව රු.290,500 ක් වූ ව්‍යාපෘති 3 ක් ඉටු කිරීමට සැලැසුම්කර තිබුණද, යෝජනා ඉදිරිපත් කළ ඇමතිවරයා විසින් එම ව්‍යාපෘති අවලංගු කරන බව දැනුම්දීම හේතුවෙන් එම ව්‍යාපෘති ඉටුකර නොතිබුණි.

**1.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2013 මැයි 03 දින කෑගල්ල දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශයේ වාහනයක් කි.මී. 40,000 ක ධාවනය කිරීමෙන් පසු සේවා සිදු කිරීම වෙනුවෙන් රු.106,740 ක් කොළඹ පුද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණි. ධාවන සටහන් හා සැලැසුම් අධ්‍යක්ෂගේ කළ වැඩ වාර්තා

අනුව එදිනම මෙම වාහනය දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්ෂේත්‍ර රාජකාරි සඳහා යොදාගෙන තිබුණි.

(ආ) ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් මාසයේ ගෙවීම්වලට ආදාල එකතුව රු.349,409 ක් වටිනා චෙක්පත් 06 ක් විගණන දිනය වූ 2014 පෙබරවාරි 07 දින වන විටත්, ආදායකයින්ට භාරදී නොතිබුණි.

## 1.9 අවිධිමත් ගනුදෙනු

--------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.210,000 ක් වටිනා පරිගණක ප්‍රින්ටර් 02 ක් හා රු.43,925 ක් වටිනා විධායක මේසයක් තරඟකාරි ලංසු ක්‍රමය අනුගමනය කිරීමකින් තොරව හා ප්‍රසම්පාදන කමිටු තීරණයකින් තොරව මිලදීගෙන තිබූ අතර, ඒ සම්බන්ධයෙන් නියමිත ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැර වීමට හේතු පැහැදිළිව වාර්තා කර විගණකාධිපති වෙත පිටපතක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) දැයට කිරුළ ජාතික වැඩ සටහන යටතේ 2013 දෙසැම්බර් 31 දිනට අවසන් කළ යුතු වූ ව්‍යාපෘති 20 ක් ආරම්භ කිරීමට 2013 වර්ෂයේ අවසන් කාර්තුවේ කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු වෙත ලබාදී තිබූ සියයට 20 ක අත්තිකාරම් ලෙස එකතුව රු.86,592,274 ක් ගෙවා තිබුණි. විධිමත් පරිදි බිල්පත්වලින් පියවීමකින් තොරව 2013 දෙසැම්බර් 31 දින එම අත්තිකාරම්, වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. නමුත් 2013 දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි. ඉහත ව්‍යාපෘතිවලට අදාල ඇස්තමේන්තු කොන්ත්‍රාත්කරු විසින් සකස්කර තිබූ අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරු විසින් ස්ථානීය පරීක්ෂාවක් කර එහි නිවැරදිතාවය තහවුරු කර නිර්දේශ කර නොතිබුණි.

(ඇ) දැයට කිරුළ 2014 යටතේ ගලිගමුව මැතිවරණ කොට්ඨාශයේ කොටියාකුඹුර ප්‍රජා ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා රු.7,884,420 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත 2013 දෙසැම්බර් 11 දින ගෙවා තිබුණි. ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ නියමිත ප්රදේශය පිළිබඳ සැලැසුමක් සහ ඊට අදාල විස්තරාත්මක ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත 2013 දෙසැම්බර් 11 දින ලබාදුන් රු.7,004,659 කින් 2014 ජූනි 20 දින වන විටත් ව්‍යපෘතිය වෙනුවෙන් වියදම් කර නොතිබුණි.

(ඈ) දැයට කිරුළ 2014 ජංගම සේවා තුළින් මතුවූ ගැටළුවලට විසඳුම් වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක් ආවරණය වන පරිදි කෘෂි ව්‍යවසායකයින්ගේ ඉඩම්වල වානිජ මට්ටමේ පළතුරු වගාවන් ස්ථාපිත කිරීමට, පළතුරු පැල වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දින රු.396,000 ක් සබරගමුව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත ගෙවා තිබුණි. 2013 දෙසැම්බර් 31 දින වන විට, අදාල පැල වර්ග ලැබී නොතිබුණි. මුදල් රෙගුලාසි 237(ආ) ප්‍රකාර විගණිත දිනය වූ 2014 ජුනි 20 දින වන විටත්, අදාල පැලවර්ග ප්‍රතිලාභීන්ට භාරදුන් බවට හා භාරගත් බවට ප්‍රතිලාභීන්ගේ නම, ලිපිනය සහිත අත්සන් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2014 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩ සටහන වෙනුවෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ මල් වගාකරුවන් සඳහා පටක රෝපන විද්‍යාගාරයක් ඉදිකිරීමට රු.2,400,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර, 2013 දෙසැම්බර් 31 දින වන විට පටක රෝපන විද්‍යාගාරය සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීමට රු.1,769,620 ක් වැයකර තිබුණි. මෙම පටක රෝපණ විද්‍යාගාරය සඳහා මුදල් වියදම් කර මාස 06 කට පසු 2014 ජුනි 18 දින සිදු කළ භෞතිකව පරීක්ෂාවකදී එම විද්‍යාගාරයේ පටක රෝපන කටයුතු ආරම්භකර නොමැති බවත්, පෞද්ගලික පැල තවානක එම විද්‍යාගාරය ඉදිකර තිබූ බවත්, මිලදීගෙන තිබූ විද්‍යාගාර උපකරණ හා රසායන ද්‍රව්‍ය එම පුද්ගලික තවාන්කරු භාරයේ තබා තිබුණි.

(ඊ) 2012 වර්ෂයේදී කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්‍රම සම්පාදන අධ්‍යක්ෂ (සැලසුම්) වෙත, පැමිණීමේ ලේඛනය, ධාවන සටහන් හා කල වැඩ වාර්තා අනුව රාජකාරි සඳහා සේවයට වාර්තා කර නොතිබූ දින 34 ක් වෙනුවෙන් නිවාඩු දින වැටුප් ලෙස රු.71,902 ක් ද, ඉදිරි වැඩසටහන් හා කළ වැඩ වාර්තා අනුමත කර නොතිබියදී සහ බැහැරයාමේ ලේඛනයේ සටහන් කර පූර්ව අනුමැතියක් ලබාගෙන නොතිබියදී නිවාඩු දින රාජකාරි ගමන්වල යෙදුනු බවට නිවැරදිතාවය තහවුරු කර ගැනීමකින් තොරව ගණකාධිකාරි වෙත දින 20 ක් සඳහා ගමන් වියදම් ලෙස රු.8,952 ක් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් පරිපාලන වියදම් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනවලින් වැය කර තිබුණි.

## 1.10 වංචනික ස්වරූපයේ ගනුදෙනු

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශයෙන් ලබාගත් තොරතුරු අනුව, කෑගල්ල සහ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලය තුළ විශ්‍රාම වැටුප් සම්බන්ධ විෂය භාර නිලධාරිනිය විසින් පරිගණක දත්ත වෙනස් කර

එකතුව රු.11,067,858 ක් ද, 2010 හා 2011 වර්ෂවලදී කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් සම්බන්ධ විෂය භාර නිලධාරියා රු.6,381,550 ක් ද, වන පරිදි එකතුව රු.17,449,408 ක විශ්‍රාම වැටුප් වංචා කර තිබුණි.

**1.11 අනාර්ථික ගනුදෙනු**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන මගින් රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිවිනැගුම වැඩ සටහන යටතේ ප්‍රතිලාභීන්ට ලබාදීම සඳහා මිටි මුරුංගා පැල 3,926 ක් මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.215,930 ක් වැයකර තිබුණද, විගණිත දිනය වූ 2013 ඔක්තෝබර් 02 දින භෞතික පරීක්ෂණයට ලක් කරන ලද පැල 250 න් සියළුම මිටි මුරුංගා පැල විනාශ වී තිබුණි.

**1.12 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන මගින් 2012 වර්ෂයේ දිවිනැගුම වැඩ සටහන යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් හරහා දිවිනැගුම ප්‍රතිලාභීන් වෙත රු.5,087,350 ක් වැයකර මසක් වයසැති කිකිළි පැටවුන් 13,936 ක් බෙදා හැර තිබුණි. 2012 ජූලි 10 දිනැති අංක 2/2012 දරන දිවිනැගුම චක්‍රලේඛයේ 5.2.1(1) ඡේදය ප්‍රකාරව ප්‍රතිලාභීන්ට ගම් කිකිළි පැටවුන් ලබාදිය යුතු වුවත්, ඒ වෙනුවට ෆාම් කිකිළි පැටවුන් ලබාදීම නිසා එම ව්‍යාපෘතියේ ඉලක්කගත අරමුණුවලින් බැහැර වී තිබුණි.

(ආ) 2011 විමධ්‍යගත අයවැය වැඩ සටහන යටතේ යටියන්තොට කොට්ඨාශයේ ලියාපදිංචි ක්‍රීඩා සමිති වෙත බෙදා හැරීම සඳහා 2011 දෙසැම්බර් 31 දින රු.72,640 ක් වැයකර ක්‍රීඩා භාණ්ඩ මිලදීගෙන තිබුණද, විගණිත දිනය වූ 2014 ජනවාරි 24 දින වන විටත් එම භාණ්ඩ අදාල සමිති වෙත බෙදා දී නොතිබුණි.

(ඇ) දැරණියගල සහ අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල කර්මාන්ත 03 ක් විගණනය විසින් භෞතිකව පරීක්ෂා කිරීමේදී මිනුම් වාර්තා අනුව දැක්වුන ප්‍රමාණයට වඩා භෞතික ප්‍රමාණයන් වෙනස් වීම නිසා එකතුව රු.13,905 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) 2012 හා 2013 වර්ෂවලදී දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විමධ්‍යගත අයවැය වැඩ සටහන යටතේ අඩි පාලම් 03 ක කොටස් ඉදිකිරීම සඳහා රු.1,018,456 ක් වැයකර තිබුණද, එම පාලම් සම්පූර්ණයෙන් නිම නොවීම නිසා වැයකර මුදලට සරිලන ප්‍රතිලාභ මහජනතාවට හිමිවී නොතිබුණි.

(ඉ) දැරණියගල සහ යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල කර්මාන්ත 02 ක් විගණනය විසින් භෞතිකව පරීක්ෂා කිරීමේදී එකතුව රු.740,594 කට ඇස්තමේන්තු කර තිබූ වැඩ විෂයයන් 09 ක් එපරිදි ඉටු නොකිරීම නිසා ඉදිකිරීම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**1.13 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 42 | 37 | 5 |
| (ii) | තෘතියික මට්ටම | 30 | 20 | 10 |
| (iii) | ද්විතියික මට්ටම | 992 | 791 | 201 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 115 | 93 | 22 |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | - | - |
| | එකතුව | 1,179 | 941 | 238 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 ඇතුළු පුරප්පාඩු 238 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.